02 බලය විමධ්‍යගත කිරීම හා බලය බෙදා හැරීම

හැඳින්වීම

රාජ්‍යයක පාලන කටයුතු පවත්වාගෙන යාම සඳහා එම රාජ්‍යයට ඇති හැකියාව බලය ලෙස සරල ව හැඳින්විය හැකි ය. බලයේ අවසාන හිමිකරුවා වන්නේ මහජනතාව වන අතර මහජනතාව සතු එම බලය පරමාධිපත්‍ය බලය ලෙස ද හඳුන්වනු ලැබේ. ඊට පාලන බලතල, ඡන්ද බලය සහ මූලික අයිතිවාසිකම් යන ක්ෂේත්‍ර තුන ඇතුළත් වේ. බලයේ විවිධ ස්වරූප පවතින අතර දේශපාලන බලය, පරිපාලන බලය, සමාජ බලය, ආර්ථික බලය ආදිය ඉන් කිහිපයකි. බලය හසුරුවනු ලබන අය තමන්ට කැමති ආකාරයට බලයට යටත් වන්නන් පාලනය කරනු ලැබීමත්, යම් හෙයකින් තම කැමැත්තට අවනත නොවන විට බල කිරීම මඟින් අවනතභාවය ලබා ගැනීමට පෙළඹීමත් දේශපාලන විද්‍යාත්මක දෘෂ්ටි කෝණයෙන් බලය යන සංකල්පය නිර්වචනය කරන එක් ආකාරයක් වේ.

රාජ්‍යයක් සතු මෙම බලය විමධ්‍යගත කිරීම මෙන් ම බෙදාහැරීම ද කළ හැකි ය. ඒ අනුව වර්තමාන රාජ්‍ය විසින් බලය විමධ්‍යගත කිරීම මෙන් ම බෙදා හැරීම ද කරනු ලැබේ. රාජ්‍යයක බලය, විමධ්‍යගත කිරීම මෙන් ම බෙදා හැරීම ද සිදු කරන්නේ එම රාජ්‍යයේ අවශ්‍යතාව පදනම් කරගෙනය. යම් රටක පරිපාලන පහසුව වෙනුවෙන් මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල පමණක් ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා දෙනු ලබන්නේ නම් එවිට බලය විමධ්‍යගත කර ඇතැයි කියනු ලැබේ. එසේ ම මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ යන ත්‍රිවිධ බලතල අතුරින් යම් ප්‍රමාණයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ම ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා දෙනු ලබන්නේ නම් එය බලය බෙදාහැරීමක් ලෙස හඳුන්වනු ලැබේ.

මෙම පාඩම් ඒකකය හොඳින් අධ්‍යයනය කිරීමෙන් ඔබට, බලය යන සංකල්පය, එහි විවිධ ස්වරූප, බලය විමධ්‍යගත කිරීම හා බලය බෙදා හැරීම, ඒකීය හා සන්ධීය රාජ්‍ය ක්‍රම, බලය විමධ්‍යගත කිරීම මෙන් ම බලය බෙදා හැරීම පිළිබඳ අප රටේ අතීත අත්දැකීම් සහ ඇමෙරිකා එක්සත් ජනපදය හා ස්විට්සර්ලන්තය යන රටවල බලය බෙදා හැර ඇති ආකාරය පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීමට හැකිවනු ඇත.

බලය

ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ක්‍රමයක බලය යන්නෙන් අදහස් කරන්නේ එම රාජ්‍යයේ පාලන කටයුතු පවත්වාගෙන යාම සඳහා එයට ඇති හැකියාවයි. එහි අවසාන හිමිකරුවා වන්නේ ජනතාව වන අතර ජනතාව සතු එම බලය පරමාධිපත්‍ය බලය ලෙස හඳුන්වනු ලැබේ. පරමාධිපත්‍ය බලයට පාලන බලතල, මූලික අයිතිවාසිකම් හා ඡන්ද බලය ඇතුළත් වේ.

1978 ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වන ව්‍යවස්ථාව අනුව පරමාධිපත්‍ය බලය ක්‍රියාත්මක වන ආකාරය විස්තර කර ඇති අයුරු පහත දැක්වේ.

(අ) ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ජනතාව විසින් තෝරා පත්කරගනු ලබන මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුව විසින් ද, ජනමත විචාරණයක දී ජනතාව විසින් ද ක්‍රියාත්මක කළ යුත්තේ ය.

(ආ) රටේ ආරක්ෂාව ඇතුළු ව ජනතාවගේ විධායක බලය ජනතාව විසින් තෝරා පත්කරගනු ලබන ජනරජයේ ජනාධිපතිවරයා විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය.

(ඇ) ජනතාවගේ අධිකරණ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කොට පිහිටුවන ලද හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගන්නා ලද නැතහොත් වෙනත් යම් නීතියකින් ඇති කොට පිහිටුවන ලද අධිකරණ, විනිශ්චය අධිකාර සහ ආයතන මඟින් පාර්ලිමේන්තුව විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය.

බලයේ විවිධ ස්වරූප

බලය යන සංකල්පය විවිධ ස්වරූප ගන්නා ආකාරය හඳුනාගත හැකි ය. දේශපාලන බලය, පරිපාලන බලය, සමාජ බලය, ආර්ථික බලය ආදිය ඊට නිදසුන් කිහිපයක් වේ.

දේශපාලන විද්‍යාත්මක දෘෂ්ටි කෝණයට අනුව ''බලය හසුරුවන අය තමන්ට කැමති ආකාරයට බලයට යටත් වන අය පාලනය කිරීමට ඇති හැකියාව සහ තම කැමැත්තට අවනත නොවන විට බල කිරීම මඟින් අවනතභාවය ලබා ගැනීමට ඇති හැකියාව'' බලය ලෙස විස්තර කර ඇත.

''ආර්ථිකයක් තුළ ආධිපත්‍යධාරී පිරිසක් විසින් අනෙකුත් අය මෙහෙයවීමට ගන්නා උත්සාහය'' බලය ලෙස ආර්ථික විද්‍යාත්මක ව විග්‍රහ කර ඇත.

''සමාජය තුළ ජීවත්වන පුද්ගලයින් සහ පවතින සමාජ සංවිධාන අබිබවා කටයුතු කිරීමට සමාජයට ඇති හැකියාව'' බලය ලෙස සමාජ විද්‍යාත්මක ව විග්‍රහ කර ඇත.

බලය විමධ්‍යගත කිරීම

බලය විමධ්‍යගත කිරීම යන්නෙන් අදහස් කෙරෙන්නේ මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල යම් ප්‍රමාණයක් ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා දීම වේ. නැතිනම් මධ්‍යම ආණ්ඩුව සතුවන බලතල පරිපාලන කටයුතු පහසු කර ගැනීම සඳහා සහ ප්‍රාදේශීය වශයෙන් පුද්ගලයින් පාලන කටයුතුවලට සහභාගි කරවා ගැනීම සඳහා ප්‍රාදේශීය ඒකක වෙත පවරා දීම වේ.

බලය විමධ්‍යගත කිරීමේ දී දැකිය හැකි විශේෂ ලක්ෂණය වන්නේ මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය විසින් සම්මත කරනු ලබන පනතක් මඟින් එය සිදු කරනු ලැබීමයි. එසේ ම එම බලතල නැවත ඕනෑ ම අවස්ථාවක මධ්‍යම ආණ්ඩුව වෙත පවරා ගත හැකි වීම ද තවත් ලක්ෂණයක් ලෙස සඳහන් කළ හැකි ය. මේ සඳහා දිය හැකි හොඳ ම නිදසුනක් නම් ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වෙත බලය විමධ්‍යගත කිරීමේ ක්‍රියාවලියයි.

බලය විමධ්‍යගත කිරීම තුළින් මධ්‍යම ආණ්ඩුව සහ එහි විවිධ ආයතනවල සිට සැලසුම් සම්පාදනය කිරීම, කළමනාකරණය, සම්පත් සපයා ගැනීම සහ බෙදහැරීම පිළිබඳ වගකීම ප්‍රාදේශීය මට්ටමේ පරිපාලන ආයතනවලට, පළාත් පාලන ආයතනවලට, පළාත් ආණ්ඩුවලට, අර්ධ ස්වාධීන රාජ්‍ය අධිකාරීවලට සහ සංස්ථාවලට පවරා තිබේ.

මධ්‍යම ආණ්ඩුවේ බලය විමධ්‍යගත කිරීම විවිධාකාරයෙන් සිදු කළ හැකි ය. පරිපාලන රටාව විමධ්‍යගත කිරීම ඉන් එක් ක්‍රමවේදයක් වන අතර ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ සිට ප්‍රාදේශීය මට්ටම දක්වා පරිපාලන බලතල විමධ්‍යගත කර ඇති අයුරු පහත නිදසුන ඇසුරින් අවබෝධ කර ගත හැකි ය.

ජාතික මට්ටම → අමාත්‍යාංශ ලේකම්
↓
දිස්ත්‍රික්මට්ටම → දිස්ත්‍රික් ලේකම්
↓
ප්‍රාදේශීය මට්ටම → ප්‍රාදේශීය ලේකම්
↓
ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටම → ග්‍රාම නිලධාරී

මධ්‍යම ආණ්ඩුවේ කාර්යයන් ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා දීම බලය විමධ්‍යගත කිරීමේ එක් ස්වරූපයක් වේ. මේ යටතේ මහ නගරසභා, නගරසභා, ප්‍රාදේශීය සභා වැනි පළාත් පාලන ආයතන ඇති කිරීම නිදසුන් ලෙස දැක්විය හැකි ය.

රාජ්‍ය ව්‍යවසායකත්වයට හෝ අධිකාරියට අයත් බලතල ප්‍රාදේශීය ඒකක වෙත පවරා දීම බලය විමධ්‍යගත කිරීමේ තවත් එක් ස්වරූපයක් වේ. එහි දී විවිධ රාජ්‍ය ව්‍යවසාය මෙහෙයවීම සඳහා විවිධ දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල, අධිකාරි වෙත අවශ්‍ය බලතල පවරා දීම සිදු කරයි. උදා:- ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය

ඒකීය රාජ්‍ය

බලය විමධ්‍යගත කිරීමේ දී සිදු වන්නේ ආණ්ඩුවේ පරිපාලන බලතල පමණක් ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා දීම වේ. නැතිනම් ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන කාර්ය මෙහෙයවනු ලබන්නේ එක් බල මධ්‍යස්ථානයකින් පමණි. රාජ්‍ය සතු

ව්‍යවස්ථාදයක, විධායක සහ අධිකරණ යන බලතල එක් මධ්‍යම ආණ්ඩුවක් සතු වන සහ ක්‍රියාත්මක කරන රාජ්‍ය ඒකීය රාජ්‍ය ලෙස හඳුන්වනු ලැබේ. ඒකීය රාජ්‍යයක් තුළ කිසිදු අයුරකින් බලය බෙදා හැරීමක් සිදු කර නැත. එසේ වුව ද පරිපාලන කටයුතු පහසු කරගැනීම වෙනුවෙන් මධ්‍යම ආණ්ඩුවේ සමහර පරිපාලන බලතල පමණක් විමධ්‍යගත කර ඇති නිසා පළාත් පාලන ආයතන වැනි ඒවා පැවතිය හැකි ය. නිදසුනක් ලෙස ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන දැක්විය හැකි ය. පරිපාලන බලතල පළාත් පාලන ආයතන වෙත පවරා දීම පාර්ලිමේන්තු පනතක් මඟින් සිදු කිරීම කරන අතර එම බලතල ඕනෑ ම අවස්ථාවක නැවත මධ්‍යම ආණ්ඩුවට පවරා ගැනීමේ හැකියාව ද ඒකීය රාජ්‍යයක් සතු වේ.

මහාචාර්ය හර්මන් ජේ. ෆයිනර් නැමති දේශපාලන විද්‍යාඥයා පෙන්වා දෙන්නේ ''සෑම ආකාරයක ම අධිකාරි බලය එක් මධ්‍යම ආයතනයක් තුළ ඒකරාශී වී තිබේ නම් එය ඒකීය රාජ්‍ය ක්‍රමයක් වන බවයි.''

ඒකීය රාජ්‍යයක ලක්ෂණ

- ආණ්ඩුව සතු ව්‍යවස්ථාදයක, විධායක සහ අධිකරණ බලතල එක් මධ්‍යම ආණ්ඩුවකින් පමණක් ක්‍රියාවට නැංවීම.
- මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන කටයුතු පහසු කර ගැනීමේ අරමුණු සහිත ව එකී පරිපාලන බලතල පමණක් ප්‍රාදේශීය පාලන ඒකක වෙත විමධ්‍යගත කර තිබීම.
- මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදයකය විසින් සම්මත කරන පනතක් මඟින් පමණක් පරිපාලන බලතල විමධ්‍යගත කිරීම.
- මධ්‍යම ආණ්ඩුවට අවශ්‍ය ඕනෑ ම අවස්ථාවක විමධ්‍යගත කරන ලද එම පරිපාලන බලතල නැවත පවරා ගත හැකි වීම.

බලය බෙදා හැරීම

මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථාදයක, විධායක සහ අධිකරණ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ප්‍රාදේශීය ආණ්ඩු ඒකක වෙත පවරා දීම බලය බෙදා හැරීම ලෙස හඳුන්වනු ලැබේ. බලය බෙදාහැරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් පමණක් සිදු කරයි.

යම් හෙයකින් අලුතින් බලය බෙදාහැරීමක් සිදු කරන්නේ නම් හෝ බෙදාහරින ලද බලතල සංශෝධනයකට ලක් කරන්නේ නම් හෝ ඒ සඳහා පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම කළ යුතු ය.

නූතන රාජ්‍යවල බලය බෙදා හැරීමට හේතු

- විවිධත්වය තුළ ඒකසත්කමක් ගොඩ නගා ගැනීමේ අවශ්‍යතාව
  යම් රාජ්‍යයක් තුළ විවිධ භාෂා කතා කරන, විවිධ ආගම් අදහන, විවිධ ජන වර්ගවලට අයත් ජන කොටස් ප්‍රාදේශීය වශයෙන් විසිරී සිටිය හැකි ය. එම කණ්ඩායම්වල අනන්‍යතාවට ගරු කරමින් පොදු ජාතිකත්වයක් යටතට ගොනු කර පාලන කටයුතුවලට සහභාගිවීම මින් අදහස් කෙරේ.
- රාජ්‍යයේ විශාලත්වය හේතුවෙන් එක් මධ්‍යස්ථානයක සිට පාලන කටයුතු සිදු කිරීමේ අපහසුතාව
- ජාතික ආරක්ෂාව තහවුරු කර ගැනීම

සන්ධීය රාජ්‍ය

මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ බලතල ප්‍රාදේශීය පාලන ඒකක වෙත පැවරීම බලය බෙදා හැරීම ලෙස ඔබ ඉගෙන ගෙන ඇත. එසේ බලය බෙදා හැරීමක් සිදු කරන ලද රාජ්‍යය සන්ධීය රාජ්‍ය ලෙස හඳුන්වනු ලැබේ. නැතිනම් මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ම ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා ඇති රාජ්‍ය සන්ධීය රාජ්‍ය වේ. රාජ්‍යයේ බලය මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර බෙදී තිබීම සන්ධීය රාජ්‍ය ක්‍රමයක මූලික ම ලක්ෂණයකි. ඒකීය රාජ්‍යයක් තුළ ඇති එක බල මධ්‍යස්ථානයක් වෙනුවට සන්ධීය රාජ්‍යයක් තුළ මධ්‍යම හා ප්‍රාන්ත වශයෙන් බල මධ්‍යස්ථාන වර්ග දෙකක් දැකිය හැකි ය. එසේ ම සන්ධීය රාජ්‍යයක් තුළ සමහරවිට මධ්‍යම ආණ්ඩුවේ නීති සහ ප්‍රාන්ත ආණ්ඩු නීති වශයෙන් නීති ක්‍රම දෙකක් ද පැවතිය හැකි ය.

සන්ධීය හෙවත් ෆෙඩරල් රාජ්‍ය බිහිවීම විවිධ හේතු සාධක පදනම් කොට ගෙන සිදු වේ. ස්වාධීන රාජ්‍ය කිහිපයක් එකට එකතු වී පාලන කටයුතු පහසු කර ගැනීම සඳහා සන්ධීය රාජ්‍ය බිහි කර ගැනීම ඉන් එක් සාධකයකි.

සන්ධීය රාජ්‍යවල ප්‍රාදේශීය ආණ්ඩු ''ප්‍රාන්ත'' යන නමින් සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන අතර සමහර අවස්ථාවල දී ප්‍රාන්ත යන නම වෙනුවට වෙනත් සුවිශේෂ යෙදුම් භාවිත කරන අවස්ථාවන් ද දැකිය හැකි ය.

උදා:- ස්විට්සර්ලන්තය තුළ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ආණ්ඩු කැන්ටන් ලෙස හැඳින්වේ.

සන්ධීය රාජ්‍යයක ලක්ෂණ

- ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවතීම.
- මධ්‍යම ආණ්ඩුවේ මෙන් ම ප්‍රාන්ත ආණ්ඩු සතු බලතල පැහැදිලි ව ව්‍යවස්ථාව තුළ අන්තර්ගත කිරීම.
- ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලය ඉහළ අධිකරණයකට පැවරීම. උදා:- ඇමෙරිකා එක්සත් ජනපදයේ සන්ධීය අධිකරණය
- ඉහළ මන්ත්‍රණ සභාවක් (උත්තර මන්ත්‍රී මණ්ඩලයක්) ඇති කිරීම. උදා:- ඇමෙරිකා එක්සත් ජනපදයේ සෙනෙට් සභාව

සන්ධීය රාජ්‍යයක සාර්ථක පැවැත්ම සඳහා තිබිය යුතු ගුණාංග

- රාජ්‍යයේ පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල ව කටයුතු කිරීම.
- සියලු ජන කොටස් පොදු හැඟීමෙන් යුතු ව කටයුතු කිරීම.
- මූල්‍යමය සම්පත් බෙදා හැරීමේ දී ඒවා සාධාරණ ලෙස ප්‍රාන්ත ආණ්ඩු වෙත ලබා දීම.

සන්ධීය රාජ්‍යයන්හි නව ප්‍රවණතා

සන්ධීය රාජ්‍ය ක්‍රමයක් තුළ මධ්‍යම ආණ්ඩුව මෙන් ම ප්‍රාන්ත ආණ්ඩු එක හා සමාන ව සලකනු ලැබේ. එසේ වුවත් ක්‍රියාත්මක වීමේ දී දැකිය හැක්කේ මධ්‍යම ආණ්ඩුව ශක්තිමත් වීමේ පොදු ප්‍රවණතාවකි. නැතිනම් මධ්‍යම ආණ්ඩුවට ප්‍රාන්ත ආණ්ඩු හැසිරවීමේ හැකියාවක් පවතී. එම තත්ත්වය ඇති වීම කෙරෙහි බලපා ඇති සාධක කිහිපයක් පෙන්වා දිය හැකි ය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා පමණක් ප්‍රාන්ත ආණ්ඩුවල කැමැත්ත ලබා ගත්ත ද සාමාන්‍ය නීති සම්පාදන කාර්යයන්හි දී ප්‍රාන්තවල කැමැත්ත නොසලකා හැරීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කරන අවස්ථාවල දී මධ්‍යම ආණ්ඩුවට වාසි සහගත වන ලෙස එය සිදු කිරීම.
- මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර මූල්‍ය ගනුදෙනු පවත්වා ගෙන යාමේ දී වඩාත් ශක්තිමත් වී ඇත්තේ මධ්‍යම ආණ්ඩුවයි. ප්‍රාන්ත ආණ්ඩු රඳා පවතින්නේ මධ්‍යම ආණ්ඩුව ලබා දෙන මූල්‍යමය ප්‍රතිපාදන මතයි. එම ප්‍රතිපාදන ලබා දීමේ දී විවිධ කොන්දේසිවලට යටත් ව ඒවා ලබා දෙයි.
- රාජ්‍ය විසින් සපයන සුබසාධන කාර්ය ඉහළ යාම තුළින් එහි වගකීම මධ්‍යම ආණ්ඩුවට පැවරීම.

- සන්නිවේදන හා ප්‍රවාහන සේවා තුළ සිදුවී ඇති අතිනවීන දියුණුව නිසා සම්බන්ධීකරණය වේගවත් වීම.
- ලෝක ආර්ථික අර්බුද හමුවේ මුළු රටට ම බලපාන ආර්ථික තීන්දු ගැනීමේ වගකීම මධ්‍යම ආණ්ඩුව වෙත පැවරීම.
- දෙවන ලෝක යුද්ධයෙන් පසු ව අන්තර්ජාතික ක්ෂේත්‍රය තුළ ඇති ව තිබෙන තත්ත්වය. උදා:- ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයාගේ බලතල වර්ධනය වීම.

බලය විමධ්‍යගත කිරීම හා බලය බෙදාහැරීම යන සංකල්ප අතර වෙනස තවදුරටත් පැහැදිලි කර ගැනීම සඳහා පහත රූප සටහන් දෙක හොඳින් අධ්‍යයනය කරන්න.

බලය විමධ්‍යගත කිරීම

ප්‍රාදේශීය පරිපාලන ඒකක
උදා: පළාත් පාලන ආයතන

ප්‍රාදේශීය පරිපාලන ඒකක
උදා: පළාත් පාලන ආයතන

මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල

ප්‍රාදේශීය පරිපාලන ඒකක
උදා: පළාත් පාලන ආයතන

ප්‍රාදේශීය පරිපාලන ඒකක
උදා: පළාත් පාලන ආයතන

බලය බෙදා හැරීම



ඉහත රූප සටහනට අනුව බලය විමධ්‍යගත කිරීම තුළ සිදු වන්නේ මධ්‍යම ආණ්ඩුවේ පරිපාලන බලතල ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා දීම පමණි. එම ප්‍රාදේශීය පාලන ඒකක ප්‍රාන්තයක් හෝ නැතිනම් ස්වාධීන රාජ්‍යයක් ලෙස හඳුන්වනු නොලබන බව ඔබ විසින් අවබෝධ කරගත යුතු ය. දනට අප රටේ ක්‍රියාත්මක වන පළාත් සභා ක්‍රමය මීට කදිම නිදසුනකි.

එසේ ම බලය බෙදා හැරීම තුළ සිදු වන්නේ මධ්‍යම ආණ්ඩුවේ කාර්ය විභේදනය කිරීමක් වන අතර එවිට ප්‍රාන්ත රාජ්‍ය හෙවත් ස්වාධීන පාලන ඒකක බිහිවන බව අවබෝධ කර ගත හැකි ය. එසේම එම ස්වාධීන පාලන ඒකක වල පරිපාලන කටයුතු පහසු කර ගැනීම සඳහා අවශ්‍ය නම් බලය විමධ්‍යගත කිරීම සිදු කළ හැකිය. සමහර සන්ධීය රජ්‍ය තුළ බලය බෙදා හැරීම මෙන්ම බලය විමධ්‍යගත කිරීම ද සිදු කර ඇති බව ඔබ විසින් තේරුම් ගත යුතුය.

ක්‍රියාකාරකම

- ඔබ උගත් කරුණු ආශ්‍රයෙන් බලය විමධ්‍යගත කිරීම හා බලය බෙද හැරීම යන සංකල්ප දෙක පිළිබඳ ව සරල නිර්වචන දෙකක් ගොඩනගන්න.

ඒකීය ආණ්ඩු

බලය විමධ්‍යගත කිරීම යන සංකල්පයෙන් අදහස් කරන්නේ කුමක් ද යන්න පිළිබඳ මීට පෙර ඔබ අධ්‍යයනය කර ඇත. බලය විමධ්‍යගත කර ඇති රාජ්‍ය ඒකීය රාජ්‍ය ලෙස අපි හැඳින්වූවෙමු. එබැවින් ඒකීය රාජ්‍ය තුළ ක්‍රියාත්මක වන ආණ්ඩු ඒකීය ආණ්ඩුක්‍රම ලෙස හඳුන්වන බව මීළඟට අවබෝධ කර ගත යුතු ය. ඒකීය ආණ්ඩුක්‍රම සම්බන්ධයෙන් ඉදිරිපත් ව ඇති නිර්වචනයක් පහත දක්වේ.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

"සෑම ආකාරයක ම අධිකාරි බලය එක් මධ්‍යම බල ආයතනයක් තුළ ඒකරාශී වී තිබේ නම් එය ඒකීය ආණ්ඩු ක්‍රමයක් වේ." - **මහාචාර්ය හර්මන් ජේ. ෆයිනර්**

ඒකීය ආණ්ඩුක්‍රම පවතින රාජ්‍යයන්ට නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

- ශ්‍රී ලංකාව
- මහා බ්‍රිතාන්‍ය
- ප්‍රංශය

ඒකීය ආණ්ඩුක්‍රමයක ලක්ෂණ

ඒකීය ආණ්ඩුක්‍රමයක් යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද යන්න පිළිබඳ ව ඔබ අවබෝධ කරගෙන ඇත. ඒකීය ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණ කිහිපයක් සම්බන්ධයෙන් දේශපාලන විද්‍යාඥයන් විසින් ඉදිරිපත් කර ඇති මතවාද දෙකක් පහත දැක්වේ.

එක් මධ්‍යම බල ආයතනයක් පමණක් නීති පැනවීම පිළිබඳ ව උත්තරීතර බලය ඉසිලීම ඒකීය ආණ්ඩුක්‍රමයක මූලික ම ලක්ෂණය වේ.

මහාචාර්ය ඒ. වී. ඩයිසි

මධ්‍යම ආණ්ඩුවේ උත්තරීතරභාවය හා අතිරේක ස්වාධිපති ආයතන ආණ්ඩුක්‍රමය තුළ නොමැතිවීම ඒකීය ආණ්ඩුක්‍රමයක දැකිය හැකි ප්‍රධාන ලක්ෂණය වේ.

මහාචාර්ය සී. එෆ්. ස්ට්‍රෝන්ග්

ඒ අනුව පොදුවේ ගත් කල ඒකීය ආණ්ඩුක්‍රමයක ලක්ෂණ පහත පරිදි දැක්විය හැකි ය.

- නීති පැනවීම සම්බන්ධයෙන් උත්තරීතර වන්නේ මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය හෙවත් පාර්ලිමේන්තුවයි.
- පරිපාලන කටයුතු පහසු කර ගැනීම සඳහා පළාත් පාලන ආයතන දක්වා බලය විමධ්‍යගත කිරීම සිදු කරයි. උදා:- ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා
- රාජ්‍යයේ ස්වාධිපති බලය එක් බල මධ්‍යස්ථානයක් (මධ්‍යම ආණ්ඩුව) වෙත ඒකරාශී වී පැවතීම.
- ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ යන ත්‍රිවිධ බලතල මධ්‍යම ආණ්ඩුව වෙත කේන්ද්‍රගත ව පැවතීම.

ඒකීය ආණ්ඩු ක්‍රමයක් පැවතීමේ වාසි

- ඉක්මනින් හා පහසුවෙන් ආණ්ඩුවට තීරණ ගැනීමට හැකි වේ.
- මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත ආණ්ඩු වශයෙන් බලය ක්‍රියාවට නංවන ආයතන පද්ධති දෙකක් නොමැති වීම නිසා ඒ දෙක අතර ඇති විය හැකි ගැටුම් අවම වේ.
- පරිපාලන ක්‍රමය මෙන් ම අධිකරණ ක්‍රමය ද සමස්ත රාජ්‍යයට ම පොදු එකක් වේ.

සන්ධීය ආණ්ඩු

සන්ධීය රාජ්‍ය තුළ ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම සන්ධීය ආණ්ඩු හෙවත් ෆෙඩරල් ආණ්ඩු ලෙස හඳුන්වනු ලැබේ. රාජ්‍යයේ බල අධිකාරිය මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර බෙදී තිබීම සන්ධීය ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ම ලක්ෂණය වේ. සන්ධීය ආණ්ඩු සම්බන්ධයෙන් විවිධ දේශපාලන විද්‍යාඥයින් ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති නිර්වචන කිහිපයක් පහත දැක්වේ.

> ''විවිධත්වය තුළින් ඒකීයත්වය ළඟා කර ගැනීමට මඟ සාදන ආණ්ඩු ක්‍රමය වේ.''
>
> **ඒ. වී. ඩයිසි**

> ''තම තමන්ගේ බල ක්ෂේත්‍රය තුළ ස්වාධීන ව ක්‍රියාත්මක වීමට හැකියාව ඇති නමුත් සමහර කරුණු සම්බන්ධයෙන් එක්සත් ව ක්‍රියාත්මක වීමටත්, මඟ පාදන උපාය මාර්ග සහිත තත්ත්වයකි.''
>
> **මහාචාර්ය කේ. සී. වියරේ**

සන්ධීය ආණ්ඩුක්‍රම පවතින රටවලට නිදසුන් :

ඇමෙරිකා එක්සත් ජනපදය, ස්විට්සර්ලන්තය, ඕස්ට්‍රේලියාව

සන්ධීය ආණ්ඩුක්‍රමයක යහපත් ලක්ෂණ

- විවිධත්වයක් පවතින ජන සමාජයක් තුළ විවිධත්වයට ගරු කිරීම මඟින් පොදු ජාතිකත්වයක් ගොඩනගා ගැනීම.
- භූමි ප්‍රමාණය විශාල රාජ්‍යවල පරිපාලන තීන්දු ගැනීමට පහසු වීම.
- ප්‍රාන්ත ආණ්ඩු විසින් මධ්‍යම ආණ්ඩුවට සිදු කරන බලපෑම් හා මැදිහත්වීම් හේතුවෙන් රාජ්‍යයක් අත්තනෝමතිකව ක්‍රියා කිරීම වැළැක්වීමේ පහසුව.
- ප්‍රජාතන්ත්‍රවාදී පාලන රාමුව ශක්තිමත් වීම.

සන්ධීය ආණ්ඩුක්‍රමයක අයහපත් ලක්ෂණ

- බලතල බෙදා දීම තුළ ප්‍රාන්ත ආණ්ඩුවලට ලැබී තිබෙන බලතලවලින් ඔවුන් සමහරවිට තෘප්තිමත් නොවීම.
- මධ්‍යම ආණ්ඩුව වෙතින් ප්‍රාන්ත වෙන් ව යාමට උත්සාහ ගැනීම පිළිබඳ ව ඇතිවී තිබෙන ප්‍රවණතාව.
- මධ්‍යම සහ ප්‍රාන්ත ආණ්ඩු අතර ව්‍යවස්ථාව මඟින් තීන්දු ගැනීම තුළ යම් යම් ක්ෂේත්‍රවලට අදාළ ව ගැටලුකාරී තත්ත්වයක් මතුවීම හා එමගින් පරිපාලනය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම.
- දෙවන මන්ත්‍රණ සභාවක් (උත්තර මන්ත්‍රී මණ්ඩලයක්) පැවතීම නිසා ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද වීම.
- ප්‍රාන්ත පරිපාලනය සඳහා හොඳ අත්දැකීම් සහිත පළපුරුදු නිලධාරීන් අවම වීම හා එමඟින් පරිපාලන ක්‍රමය බිඳ වැටීමකට ලක් විය හැකි වීම.

ක්‍රියාකාරකම

ඒකීය හා සන්ධීය ආණ්ඩුක්‍රම අතර වෙනස්කම් ලැයිස්තුවක් පිළියෙල කරන්න.

ශ්‍රී ලංකාවේ බලය බෙදා හැරීමේ හා බලය විමධ්‍යගත කිරීමේ ඉතිහාසය

ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීමේ ඉතිහාසය

බලය විමධ්‍යගතකරණය යන සංකල්පය ශ්‍රී ලංකාවට අලුත් දෙයක් නොවේ. ඈත අතීතයේ පටන් අප රටේ පැවති පාලන ක්‍රම දෙස බලන විට පෙනී යන්නේ පාලනයේ පහසුව සඳහා නොයෙක් අයුරින් බලය විමධ්‍යගත කර ඇති බවයි.

නිදසුන් :

අනුරාධපුර යුගය තුළ පණ්ඩුකාභය රජු විසින් ගම් පාලනය කිරීම සඳහා ''ගම්භාර'' ''ගාමණි'' වැනි නිලධාරීන් පත් කිරීම.

පොළොන්නරු යුගය තුළ මහා පරාක්‍රමබාහු රජු විසින් ප්‍රාදේශීය පාලකයන් පත් කිරීම හා ඔවුන්ට පාලන බලතල ලබා දීම.

බටහිර ජාතීන් අප රටට සංක්‍රමණය වීමත් සමඟ තවදුරටත් ප්‍රාදේශීය පාලන නිලධාරීන් පත් කර රට පාලනය කිරීමට කටයුතු කිරීම.

නිදසුන් :

ක්‍රි. ව. 1815 දී බ්‍රිතාන්‍යයන් විසින් පළාත් මට්ටමින් රෙසිඩන්ට්වරයකු පත් කිරීම.

බ්‍රිතාන්‍ය පාලන සමය තුළ ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කර තිබූ ආකාරය

බ්‍රිතාන්‍ය පාලන යුගය තුළ ප්‍රධාන වශයෙන් ලංකාවේ බලය විමධ්‍යගත කිරීම සිදුව ඇති ආකාරය හඳුනා ගත හැකි වන්නේ ක්‍රි. ව. 1865 දී මහ නගර සභා ආඥා පනත සම්මත කිරීමත් සමඟ ය. ඒ යටතේ ක්‍රි. ව. 1865 දී කොළඹ සහ ක්‍රි. ව. 1866 දී මහනුවර යන ප්‍රධාන නගර දෙක පදනම් කොට ගනිමින් මහ නගර සභා ස්ථාපිත කරන ලදී. වර්තමානයේ අප රටේ ක්‍රියාත්මක වන බලය විමධ්‍යගත කිරීමේ තත්ත්වය ස්ථාපිත වීම කෙරෙහි බ්‍රිතාන්‍ය පාලන ක්‍රමය බොහෝ දුරට බලපා ඇත.

ක්‍රි. ව. 1871 දී ගම් සභා ක්‍රමය නැවත ස්ථාපිත කරන ලදී. එම වසරේ පැනවූ ආඥා පනතක් මඟින් ගම්වල පැන නඟින සුළු ආරවුල් විසඳීම, ගොවිතැන් හා වාරිමාර්ග කටයුතු පිළිබඳ ප්‍රශ්න විසඳීම, සෞඛ්‍ය ආරක්ෂාව සැලසීම ආදිය ගම් සභාවට පැවරුණි. 1931 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ පළාත් පාලන කටයුතු වෙනුවෙන් විධායක කාරක සභාවක් පිහිටුවීම හරහා ගම් කාර්ය සභාවල බලතල තවදුරටත් පුළුල් කරන ලදී. එසේ ම 1940 දී නගර සභා පිහිටුවීම, 1943 දී පළාත් පාලන ආඥා පනත සම්මත කිරීම යන අවස්ථා දෙක හරහා බ්‍රිතාන්‍ය පාලන යුගය තුළ තවදුරටත් බලය විමධ්‍යගත කිරීම සඳහා පියවර ගෙන ඇත.

නිදහසින් පසු යුගය තුළ බලය විමධ්‍යගත කිරීම සඳහා ගත් උත්සාහයන්

1948 නිදහස ලබා ගැනීමෙන් පසු ව ද පැවති පළාත් පාලන ආයතන ක්‍රමය තවදුරටත් පවත්වා ගෙන යාම දැකිය හැකි ය. 1973 බලය විමධ්‍යගත කිරීම සඳහා දේශපාලන අධිකාරි ක්‍රමය ස්ථාපිත කරනු ලැබීය. දිස්ත්‍රික් මට්ටමින් පරිපාලනය ක්‍රියාත්මක කිරීමේ දී දේශපාලන නායකත්වයක් ලබා දීම සඳහා සමගි පෙරමුණු ආණ්ඩුව මෙහි දී උත්සාහ ගනු ලැබීය. ඉන් අනතුරු ව 1980 දී දිස්ත්‍රික් අමාත්‍ය ක්‍රමය හරහා දිස්ත්‍රික් සංවර්ධන සභා ක්‍රියාත්මක කළ අතර ගම් සභා හා සුළු නගර සභා අහෝසි කිරීම සිදු කළේ ය. අනතුරු ව 1981 දී ප්‍රාදේශීය මණ්ඩල, ග්‍රාමෝදය මණ්ඩල ක්‍රියාත්මක කිරීමට පටන් ගැනුණි. නැවත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට අනුව ප්‍රාදේශීය සභා ඇති කළේ ය.

ශ්‍රී ලංකාවේ බලය බෙදාහැරීම සඳහා ගෙන ඇති උත්සාහයන්

අප රටේ බලය බෙදාහැරීම පිළිබඳ ව අදහස් ඉදිරිපත් ව ඇත්තේ මීට සියවසකට ආසන්න කාලයක සිට ය. 1926 දී එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා විසින් උඩරට ප්‍රදේශ සඳහා සන්ධීය රාජ්‍යයක් ලබා දීම පිළිබඳ ව දක්වන ලද යෝජනා මින් ප්‍රමුඛ වේ. ඉන් අනතුරු ව නිදහසින් පසු ව බලය බෙදාහැරීම සඳහා ගත් උත්සාහයක් ලෙස 1957 දී එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා හා එස්.ජේ.වී. චෙල්වනායගම් මහතා අතර ඇති කරගත් බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම හා 1965 ඩඩ්ලි - චෙල්වනායගම්

ගිවිසුම මෙයට නිදසුන් වේ. එහෙත් මෙම ගිවිසුම් ඒ අයුරින් ම ක්‍රියාවට නැඟීමේ හැකියාව නොලැබුණි.

මෑත කාලය ගත් විට එනම් 1970-80 දශකවල බලය බෙදහැරීමේ ක්‍රියාවලිය කෙරෙහි නැඹුරුවීමේ ප්‍රවණතාවක් දක්නට ලැබුණි. නමුත් එවකට බලයේ සිටි ආණ්ඩු ඒ සඳහා සෘජු ව මැදිහත් නොවුණු අතර ඔවුන් බොහෝ විට යොමු වූයේ බලය බෙදහැරීමක් නොකර බලය විමධ්‍යගත කිරීම කෙරෙහි ය.

ශ්‍රී ලංකාවේ පළාත් සභා පිහිටුවීම

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනය හා 1987 අංක 42 දරන පාර්ලිමේන්තු පනත මඟින් ඒ වන විට පැවති පළාත් 09 පදනම් කරගෙන ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය ඇති කළේ ය. ඒ බව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII අ පරිච්ඡේදයේ 154 අ (1) ව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වේ.

> ජනාධිපතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් නියම කරන දිනයේ හෝ දිනවල සිට ක්‍රියාත්මක වන පරිදි අටවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් සෑම පළාතක් ම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත් ව, පළාත් සභාවක් මෙයින් පිහිටුවනු ලැබේ. වෙනස් වෙනස් පළාත් සඳහා වෙනස් වෙනස් දිනයන් නියම කරනු ලැබිය හැකි ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අටවන උපලේඛනයේ දැක්වෙන පරිදි ශ්‍රී ලංකාවේ පළාත් 09 පහත දැක්වේ.

- බස්නාහිර පළාත
- වයඹ පළාත
- ඌව පළාත
- සබරගමුව පළාත
- මධ්‍යම පළාත
- නැගෙනහිර පළාත
- දකුණු පළාත
- උතුරු මැද පළාත
- උතුරු පළාත

ශ්‍රී ලංකාවේ පළාත් සිතියම



පළාත් සභාවක ආයතනික ව්‍යුහය

පළාත් සභාවක ආයතනික ව්‍යුහය ගොඩනැඟී තිබෙන්නේ ආණ්ඩුකාරවරයා, මහ ඇමතිවරයා, අමාත්‍ය මණ්ඩලය සහ පළාත් සභා මන්ත්‍රී මණ්ඩලය යන ප්‍රධාන ඒකක කිහිපය ඒකරාශී වීමෙන් වේ. එම ආයතනික ව්‍යුහය පහත දැක්වෙන පරිදි සරල රූප සටහනකින් පෙන්වා දිය හැකි ය.



ඒ අනුව ආණ්ඩුකාරවරයා, මහ ඇමතිවරයා සහ අමාත්‍ය මණ්ඩලය, පළාත් සභාව යන ආයතන පිළිබඳවත් ඒවා සතු බලතල හා කාර්ය කිහිපයක් පිළිබඳවත් දළ අවබෝධයක් ලබා දීමට මින් උත්සාහ කෙරේ.

පළාත් ආණ්ඩුකාරවරයා

සෑම පළාත් සභාවක් සඳහා ම ආණ්ඩුකාරවරයකු සිටින අතර මධ්‍යම ආණ්ඩුව සහ පළාත් සභාව අතර සම්බන්ධීකරණය සිදු කරන නියෝජිතයා වන්නේ ඔහු ය. පළාත් ආණ්ඩුකාරවරයා පත් කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසින් වන අතර නිල කාලය වසර 05කි. නිල කාලය ඉකුත් වීමට පෙර ආණ්ඩුකාරවරයා හට සිය ධූරයෙන් ඉල්ලා අස්විය හැකි ය. එසේ ම පළාත් සභා මන්ත්‍රීවරුන් විසින් 2/3ක බහුතර ඡන්දයෙන් සම්මත කරනු ලබන යෝජනාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබීමෙන් අනතුරුව ද ආණ්ඩුකාරවරයාව සිය ධූරයෙන් ඉවත් කළ හැකි ය. ආණ්ඩුකාරවරයා සම්බන්ධයෙන් 1978 ව්‍යවස්ථාවේ 154 ආ (1) හා (2) ව්‍යවස්ථාවල මෙසේ සඳහන් වේ.

154 අ වන ව්‍යවස්ථාවට අනුකූල ව පළාත් සභාවක් පිහිටවනු ලැබ ඇති සෑම පළාතක් සඳහා ම ආණ්ඩුකාරවරයකු සිටිය යුතු ය.

ජනාධිපතිවරයා විසින් සිය අත්සන යටතේ වූ අධිකාර පත්‍රයක් මගින් ආණ්ඩුකාරවරයා පත් කරනු ලැබිය යුතු අතර, ජනාධිපතිවරයාගේ ප්‍රසාදය ඇති තාක් කල් 4 (ආ) වන ව්‍යවස්ථාවට අනුකූල ව ඔහු විසින් සිය ධූරය දැරිය යුත්තේ ය.

ආණ්ඩුකාරවරයා සතු බලතල හා කාර්ය

- පළාත් සභාව කැඳවීම, වාර අවසාන කිරීම හා විසුරුවා හැරීම
- පළාත් සභාව ඇමතීම හා සංදේශ යැවීම
- ප්‍රධාන ඇමතිවරයා පත් කිරීම, අමාත්‍ය මණ්ඩලය හා අනෙක් පළාත් විධායක නිලධාරීන් පත් කිරීම
- පළාත් සභා ප්‍රඥප්තීන් අනුමත කිරීම
- හදිසි අවස්ථාවන්හි දී ජනාධිපතිවරයාගේ උපදෙස් අනුව ක්‍රියා කිරීම. උදා:- පළාත් පරිපාලන යාන්ත්‍රණය බිඳ වැටීම, මූල්‍යමය අස්ථාවරභාවය
- මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව අතර සම්බන්ධීකරණය සිදු කිරීම
- පළාත් සභාවේ නාමික විධායකය වශයෙන් පළාත් මහ ඇමතිවරයාගේ උපදෙස් මත ක්‍රියා කිරීම

මහ ඇමති සහ අමාත්‍ය මණ්ඩලය

සෑම පළාතක ම පළාත් සභාවක් ප්‍රධාන ඇමතිවරයෙකු මෙන් ම තවත් අමාත්‍යවරු සිවු දෙනෙකුට නොවැඩි පිරිසකගෙන් සමන්විත විය යුතු බව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වේ. පළාත් සභා මන්ත්‍රීවරුන් අතරින් ඔවුන් තෝරාගනු ලැබේ. ආණ්ඩුකාරවරයාගේ කටයුතු සඳහා සහාය වීම මෙන් ම ඒ සඳහා උපදෙස් ලබා දීම අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධාන කාර්යයකි. ප්‍රධාන ඇමතිවරයා පත් කිරීම ආණ්ඩුකාරවරයාගේ කාර්යයක් වන අතර එසේ පත් කළ යුත්තේ පළාත් සභාවේ මන්ත්‍රීවරුන් බහුතරයකගේ සහාය ලැබෙන තැනැත්තා වේ. ප්‍රධාන ඇමතිවරයාගේ උපදෙස් මත ආණ්ඩුකාරවරයා විසින් පළාත් සභාවේ සෙසු ඇමතිවරුන් පත් කළ යුතු ය. ප්‍රධාන අමාත්‍යවරයා මෙන් ම අනෙක් අමාත්‍යවරු සිය කටයුතු සම්බන්ධයෙන් පළාත් සභාවට සාමූහික ව වගකීමට බැඳී සිටිති.

මහ ඇමති සහ අමාත්‍ය මණ්ඩලය සතු බලතල හා කාර්යය

- පළාත් ආණ්ඩුකාරවරයාට උපදෙස් ලබා දීම
- පළාත් අයවැය ලේඛනය සකස් කිරීම
- පළාතේ ආර්ථික සංවර්ධන හා පරිපාලන සැලසුම් සකස් කිරීම මෙන් ම ඒවා ක්‍රියාත්මක කිරීම

පළාත් සභාව

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ එතෙක් ශ්‍රී ලංකාව බෙදූ තිබුණු පළාත් 09 සඳහා පළාත් සභා පිහිටුවන ලද බව මේ වන විටත් ඔබ විසින් අවබෝධ කරගෙන ඇත. එසේ ඇති කරන ලද පළාත් සභා සඳහා වෙන් වෙන් වශයෙන් පළාත් සභාව ස්ථාපනය වන බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 අ (2) අනු ව්‍යවස්ථාවේ සඳහන් වේ.

154 අ (1) අනු ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද සෑම පළාත් සභාවක් ම, පළාත් සභා ඡන්ද විමසීම්වලට අදාළ නීතියට අනුකූල ව එම සභාවේ මන්ත්‍රීවරුන් තෝරා පත් කරගනු ලැබූ විට සංස්ථාපනය විය යුතු ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඈ (1) ව්‍යවස්ථාවේ පළාත් සභාවේ සංයුතිය පිළිබඳ සඳහන් වේ. ඒ අනුව පළාත් සභාව පිහිටුවනු ලැබ ඇති පළාතේ වර්ග ප්‍රමාණය හා ජනගහනය සැලකිල්ලට ගෙන නීතියෙන් තීරණය කරනු ලබන පරිදි මන්ත්‍රීවරුන් සංඛ්‍යාව තීරණ කරනු ලබයි.

පළාත් සභාවක නිල කාලය වසර 05ක් වන අතර යම් හෙයකින් නියමිත නිල කාලය ඉක්ම යාමට පෙර විසුරුවා නොහැරිය හොත් එම පස් අවුරුදු නිල කාලය ඉක්ම යාමත් සමඟ අදාළ පළාත් සභාව විසිර ගියා සේ සලකනු ලබයි. එසේ ම පළාත් සභා සඳහා සියලු මන්ත්‍රීවරුන් මහජන ඡන්දයෙන් පමණක් තෝරා ගනු ලැබේ.

පළාත් සභාව සතු ප්‍රධාන කාර්යය වන්නේ ව්‍යවස්ථාවේ 09 වන උපලේඛනයේ සඳහන් පළාත් සභා බලතල ලැයිස්තුවට අදාළ ව යම් යම් කාරණා සම්බන්ධයෙන් ප්‍රඥප්ති සම්පාදනය හා ඒවා සම්මත කිරීම වේ. එසේ ම පළාත් අයවැය ලේඛනය සම්මත කිරීමත්, පළාත තුළ ඇති යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට අදාළ තීන්දු තීරණ ගැනීමත් සිදු කරනු ලබයි. එසේ ම පළාත් මහ ඇමති සහ සිවු දෙනෙකුට නොවැඩි අමාත්‍ය මණ්ඩලයක් තෝරා පත් කරගනු ලබන්නේ පළාත් සභාවේ මන්ත්‍රීවරුන් අතුරින් වේ.

පළාත් සභා සතු බලතල හා කාර්යය

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව ලැයිස්තු 03ක් පදනම් කරගෙන බලතල වර්ගීකරණය කර ඇත.

- I වන ලැයිස්තුව (පළාත් සභා ලැයිස්තුව)
- II වන ලැයිස්තුව (සංවෘත ලැයිස්තුව)
- III වන ලැයිස්තුව (සමගාමී ලැයිස්තුව)

ඒ අනුව මධ්‍යම ආණ්ඩුව, පළාත් සභා සහ එම ආයතන දෙකට පොදුවේ භුක්ති විඳිය හැකි බලතල හෙවත් සමගාමී බලතල ලැයිස්තුව යන ප්‍රධාන ක්ෂේත්‍ර 03ක් ඔස්සේ බලතල හා කාර්ය වර්ගීකරණය කරනු ලබයි. එම ලැයිස්තු 03 හා ඊට අදාළ බලතල පිළිබඳ මීළඟට ඔබට හැදෑරීමට හැකිවනු ඇත.

I වන ලැයිස්තුව (පළාත් සභා ලැයිස්තුව / පළාත් සභා සතු බලතල)

1 වන ලැයිස්තුව හෙවත් පළාත් සභා ලැයිස්තුව මඟින් විස්තර කරනු ලබන්නේ පළාත් සභා සතු බලතල හා කාර්ය වේ. එම ලැයිස්තුව යටතේ පළාත් සභා සතු බලතල හා කාර්ය 37ක් දක්වා තිබේ. නිදසුන් ලෙස පළාත්වලට අදාළ ආර්ථික සැලසුම් ක්‍රියාත්මක කිරීම, පළාත් පාලන කටයුතු, පළාත්වල නිවාස හා සංවර්ධන වැඩසටහන් මෙන් ම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, සමාජසේවා හා පුනරුත්ථාපන කාර්ය සිදු කිරීම, පළාත්බද කාර්ය සඳහා කෘෂිකාර්මික ව්‍යාප්තිය, සුළු වාරිමාර්ග වැඩ කටයුතු පුනරුත්ථාපනය හා නඩත්තු කිරීම ආදිය නිදසුන් කිහිපයක් ලෙස දැක්විය හැකි ය. පළාත් සභා සතු බලතල සම්බන්ධයෙන් එකී පළාත් සභාවට ප්‍රඥප්ති සෑදීමේ හැකියාව පවතින අතර පනත් සම්මත කිරීමේ බලයක් හිමි නොවීම විශේෂ ලක්ෂණයකි.

II වන ලැයිස්තුව (සංචෘත ලැයිස්තුව/මධ්‍යම ආණ්ඩුව සතු බලතල)

මධ්‍යම ආණ්ඩුව විසින් ක්‍රියාවට නංවනු ලබන විෂය කරුණු 17ක් සම්බන්ධ බලතල මෙම දෙවන ලැයිස්තුව හෙවත් සංචෘත ලැයිස්තුව තුළ දක්වා තිබේ. ජාතික වශයෙන් අතිශය වැදගත් විෂය කරුණු මෙම සංචෘත ලැයිස්තුව තුළට අන්තර්ගත කර ඇති අතර ඊට අදාළ නීති සම්පාදනය කිරීමේ තනි හා අනන්‍ය වූ බලය පාර්ලිමේන්තුව සතු වේ. ඒ අනුව දෙවන ලැයිස්තුව තුළ අන්තර්ගත බලතල කිහිපයක් නිදසුන් ලෙස පහත දැක්වේ.

- සියලු විෂයයන් සහ කර්තව්‍ය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්පාදනය
  මේ යටතේ රාජ්‍ය ආරක්ෂාව හා ජාතික සුරක්ෂිතභාවය, අභ්‍යන්තර ආරක්ෂාව, නීතිය හා යථා පැවැත්ම වැනි කාරණා සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ බලය හිමි වේ.

- විදේශ කටයුතු
  ශ්‍රී ලංකාව විසින් වෙනත් විදේශ රටක් සමඟ සම්බන්ධ වන සියලු කරුණු, රාජතාන්ත්‍රික කටයුතු, එක්සත් ජාතීන්ගේ සංවිධානය, ජාත්‍යන්තර සමුළුවලට සහභාගි වීම, ඒවායේ දී එළඹෙන තීරණ ක්‍රියාවට නැඟීම, විදේශ ගිවිසුම්, සම්මුති ඇති කර ගැනීම හා ඒවා ක්‍රියාවට නැඟීම, යුද්ධය හා සාමය, විදේශ අධිකරණ බලය ආදිය මීට අයත් වේ.

- ජාතික ආදායමට මූල්‍ය ප්‍රතිපත්තියට හා විදේශ සම්පත්වලට අදාළ මුදල් පිළිබඳ කටයුතු
- අධිකරණයට සහ අධිකරණ පද්ධතියට අදාළ වන තාක් දුරට යුක්තිය පසිඳලීම
- ආගමනය හා විගමනය සහ පුරවැසිභාවය
- ජනලේඛන හා සංඛ්‍යාලේඛන

III වන ලැයිස්තුව (සමගාමී ලැයිස්තුව)

මධ්‍යම ආණ්ඩුව සහ පළාත් සභා යන ආයතන දෙවර්ගයට ම සමසේ භුක්ති විඳිය හැකි බලතල III වන ලැයිස්තුව හෙවත් සමගාමී ලැයිස්තුව ලෙස දක්වා ඇත. මෙම සමගාමී ලැයිස්තුව තුළ බලතල වර්ග 36ක් වේ. එම බලතල කිහිපයක් නිදසුන් ලෙස පහත දැක්වේ.

- සැලසුම් කිරීම

  මේ යටතේ පළාත්බද මට්ටමේ දී සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ක්‍රම ඇති කිරීම සහ ඇගයීම, ප්‍රගති පාලනය, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයෝජන වැඩසටහන්වල ප්‍රගතිය පසු විපරම් කිරීම

- ජාතික නිවාස සහ ඉදි කිරීම

  නාගරික සංවර්ධන ප්‍රදේශවල ආර්ථික සමාජමය සහ භෞතික සංවර්ධනය පිළිබඳ ඒකාබද්ධ ක්‍රම සැලසුම් ප්‍රවර්ධනය කිරීම හා ඒ සැලසුම් ක්‍රියාත්මක කිරීම

- සමාජසේවා සහ පුනරුත්ථාපන

  උන් හිටි තැන් අහිමි වූවන්ට සහන සැලසීම, ඔවුන් පුනරුත්ථාපනය කිරීම සහ සහන සැලසීම, ගං වතුර, නියඟ, වසංගත හෝ වෙනත් අසාමාන්‍ය කරුණු නිසා ඇති වූ ආපදාවල දී සහන සැලසීම, ඒවායින් හානියට පත් වූ තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම හා නැවත පදිංචි කිරීම.

- කෘෂිකර්මය හා ගොවිජන සේවා

  කෘෂිකර්මයට සම්බන්ධ කර්මාන්ත පිහිටුවීම සහ වැඩිදියුණු කිරීම, ගොවිපොළවල් පිහිටුවීම හා නඩත්තුව, පෞද්ගලික තවාන් අධීක්ෂණය, පස සංරක්ෂණය

පළාත් පාලන ආයතන

මධ්‍යම ආණ්ඩුවේ පරිපාලන කටයුතු පහසු කර ගැනීමේ අරමුණින් මෙන් ම කාර්යක්ෂම මහජන සේවාවක් සැපයීම ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකාවේ වත්මන් පළාත් පාලන ආයතන පද්ධතිය ස්ථාපිත කර තිබේ. යම් නිශ්චිත භූමි ප්‍රදේශයක් පදනම් කරගෙන ජනතා නියෝජිතයන්ගේ මෙන් ම මහජනතාවගේ සහභාගිත්වයෙන් ජනතා අවශ්‍යතා ඉටු කර ගත හැකි වීම පළාත් පාලන ආයතන පද්ධතිය තුළින් දැකිය හැකි ය. මෙම පළාත් පාලන ආයතන පද්ධතිය මෙන් ම ඉන් ඉටුවන කාර්යභාරය පිළිබඳ ව ඔබ 9 වන ශ්‍රේණියේ දී අධ්‍යයනය කර ඇත. එබැවින් මෙහි දී පළාත් පාලන ආයතනයක ප්‍රධාන නිලධාරීන් හා ඔවුන්ගේ කාර්යභාරය පමණක් හැදෑරීමට ඔබට අවස්ථාව උදවනු ඇත. පහත දැක්වෙන්නේ දැනට අප රටේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන හා ඒවායේ ප්‍රධාන පරිපාලන නිලධාරී තනතුරු කිහිපයකි.

මහ නගර සභාව	→	නගරාධිපති/උප නගරාධිපති
නගර සභාව	→	සභාපති/උප සභාපති
ප්‍රාදේශීය සභාව	→	සභාපති/උප සභාපති

නගරාධිපති/සභාපති සතු බලතල හා කාර්ය

- නගර සභාවේ, ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස ක්‍රියා කිරීම
- සභාව කැඳවීම, මුලසුන ගැනීම හා සභාව කල් තැබීම
- අයවැය ලේඛනය හා සැලසුම් සකස් කිරීම මෙන් ම ඒ සඳහා සභාවෙන් අනුමැතිය ලබා ගැනීම
- තම බල ප්‍රදේශයට අදාළ සංවර්ධන සැලසුම් සකස් කිරීම හා ඒවා ක්‍රියාවට නැගීම
- මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව සමග සම්බන්ධීකරණ කටයුතු පවත්වා ගෙන යාම
- මහජන උපයෝගිතා සේවාවන් සැපයීමට මුල් වීම

උප නගරාධිපති/උප සභාපති සතු බලතල හා කාර්ය

- මහ නගර සභාවේ නගරාධිපතිට, නගර සභාවේ/ ප්‍රාදේශීය සභාවේ සභාපතිට අවශ්‍ය සහාය ලබා දීම
- නගරාධිපති/සභාපති නොමැති අවස්ථාවල සභාවේ කටයුතු පවත්වා ගෙන යාම

මහ සභාව

පළාත් පාලන ආයතනයක ප්‍රතිපත්ති සම්පාදනය කරන ආයතනය ලෙස මහ සභාව හැඳින්විය හැකි ය. මෙය අදාළ පළාත් පාලන බල ප්‍රදේශයේ ඡන්දදායකයන්ගේ ඡන්දය පදනම් කර ගෙන එම පළාත් පාලන ආයතනය සඳහා තෝරා ගන්නා නියෝජිතයන්ගෙන් සමන්විත වේ. එම මහ සභාව තුළින් නගරාධිපති, සභාපති / උප නගරාධිපති, උප සභාපති යන තනතුරු සඳහා නිලධාරීන් පත් කර ගනු ලැබේ. ප්‍රතිපත්ති හා සැලසුම් සම්පාදනය කිරීම මෙන් ම සභාවේ අය වැය සම්මත කිරීමත්, පාලන කටයුතු කරගෙන යාම සඳහා නගරාධිපතිට / සභාපතිට අවශ්‍ය සහාය ලබා දීමත් එමඟින් ඉටු කරනු ලබන බලතල හා කාර්ය අතර ප්‍රමුඛ වේ.

තෝරාගත් රටවල ව්‍යුහාත්මක වෙනස්කම්

ඇමෙරිකා එක්සත් ජනපදය සන්ධීය රාජ්‍යයක් ලෙස බිහිවීමට හේතු

ජනපද 13කින් ඇරඹුණු ඇමෙරිකා එක්සත් ජනපදය වර්තමානයේ ප්‍රාන්ත 50කින් සමන්විත සන්ධීය රාජ්‍යයක් වේ. මෙම මුල් ජනපද 13 පිහිටා තිබුණේ ඇමෙරිකා එක්සත් ජනපදයේ නැගෙනහිර වෙරළ ආශ්‍රිත ව වේ.

එම ජනපද 13 සන්ධීය රාජ්‍යයක් බිහි කර ගැනීමට පෙර ස්වාධීන පාලන ඒකක වශයෙන් පැවතුණි. එහෙත් පසුකාලීන ව ජාතික ආරක්ෂාව තහවුරු කර ගැනීම මෙන් ම ආර්ථික සංවර්ධනය ළඟා කර ගැනීම පෙරදැරි කරගෙන එක්සත් ජනපදයක් වශයෙන් ඒකරාශී විය. එහි ප්‍රතිඵලය වූයේ ජනපද 13කින් සමන්විත ඇමෙරිකා එක්සත් ජනපදය නැමති රාජ්‍යය බිහි වීමයි. එසේ ම දීර්ඝ කාලයක් බ්‍රිතාන්‍ය යටත් විජිතයක් ව පැවතීම හේතු කොට ගෙන මුහුණ දුන් කටුක අත්දැකීම් නැවත ඇති නොවීම සඳහා ශක්තිමත් රාජ්‍යයක් ගොඩ නඟා ගැනීමේ අවශ්‍යතාව ද මෙහි දී මුල් විය.



2.1 රූපය
ප්‍රාන්ත 13 දක්වෙන සිතියම

ඇමෙරිකා එක්සත් ජනපදය ක්‍රි. ව. 1787 දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කරන විට බලය බෙදා හැරීමට අදාළ නීති ඊට ඇතුළත් කර තිබුණි. ඒ අනුව මධ්‍යම ආණ්ඩුවේ බලතල පමණක් ව්‍යවස්ථාවට ඇතුළත් කළ අතර ඉතිරි සියලු බලතල ප්‍රාන්ත ආණ්ඩුවලට හිමි කර දෙන ලදී. ඉන් අපේක්ෂා කරනු ලැබුවේ ප්‍රාන්ත ආණ්ඩු ශක්තිමත් කිරීමයි.

ඇමෙරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම ව්‍යුහය

- විධායක ජනාධිපති විසින් විධායක බලතල ක්‍රියාත්මක කිරීම.
- ව්‍යවස්ථාදායකය වන කොංග්‍රස් මණ්ඩලය නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හා සෙනෙට් සභාව යන ආයතන දෙකකින් සමන්විත වීම. (ද්වි මාණ්ඩලික වීම)
- ජනාධිපතිවරයා විසින් සමහර බලතල ක්‍රියාවට නැංවීමේ දී සෙනෙට් සභාවේ අනුමැතිය ලබා ගත යුතු වීම.

  උදා:- යුද්ධය ප්‍රකාශ කිරීම, උසස් රාජ්‍ය නිලධාරීන් පත් කිරීම. (තානාපතිවරු, උසස් අධිකරණ විනිසුරුවන්, අන්තර් ජාතික ගිවිසුම් අත්සන් කිරීම)
- මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර බලතල ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් මතු වුවහොත් එය විසඳීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයට බලය හිමි වීම.
- එක් එක් ප්‍රාන්තවල අභිලාෂයන් නියෝජනය කිරීම සඳහා ප්‍රාන්තයකින් දෙදෙනෙකු බැගින් සෙනෙට් සභාවට නියෝජිතයන් 100 ක් පත් කිරීම.
- ෆෙඩරල් අධිකරණ පද්ධතියක් ක්‍රියාත්මක වීම.
- කොංග්‍රස් මණ්ඩලය විසින් සම්මත කරන පනත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි වන්නේ නම් ඒවා ප්‍රතික්ෂේප කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට හිමි වීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා මධ්‍යම ආණ්ඩුවේ 2/3 බලයක් ද, ප්‍රාන්ත ආණ්ඩුවල 3/4 බලයක් ද අවශ්‍ය වීම.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.



2.2 රූපය ප්‍රාන්ත 50කින් යුත් වර්තමාන ඇමෙරිකා එක්සත් ජනපදය

ඇමෙරිකා එක්සත් ජනපදයේ සන්ධීය ව්‍යවස්ථාවට අනුව බලතල බෙදූ ඇති අයුරු

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මධ්‍යම ආණ්ඩුව සතු බලතල සඳහන් කර ඉතිරි බලතල සියල්ල ප්‍රාන්තවලට ලබා දී ඇත. ඉන් ගම්‍ය වන්නේ මධ්‍යම ආණ්ඩුවට සාපේක්ෂ ව වැඩි බලතල ප්‍රමාණයක් සහිත ශක්තිමත් ප්‍රාන්ත රාජ්‍ය ක්‍රමයක් ගොඩනැඟීමට ව්‍යවස්ථා සම්පාදකයින් උත්සාහ දරා ඇති බවයි. ඇමෙරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත සතු බලතල කිහිපයක් පහත දැක්වේ.

මධ්‍යම ආණ්ඩුව සතු බලතල	ප්‍රාන්ත රාජ්‍යයන්ට හිමි බලතල
• බදු පැනවීම හා එක්රැස් කිරීම • මූල්‍ය කටයුතු • ජාතික ආරක්ෂාව සැලසීම • විදේශ වෙළෙඳාම හා විදේශ කටයුතු • ජාතික ආර්ථිකය සංවර්ධනය	• අධ්‍යාපනය • සෞඛ්‍යය • නිවාස, ඉදිකිරීම් • පළාත් පාලනය, මහාමාර්ග

වර්තමානයේ ඇමෙරිකා එක්සත් ජනපදය තුළ ප්‍රාන්ත ආණ්ඩු ඉක්මවා යමින් මධ්‍යම ආණ්ඩුව ශක්තිමත් වීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබේ. ඊට හේතු ගණනාවක් ඇති අතර ඉන් කිහිපයක් පහත දැක්වේ.

- සමාජ, දේශපාලන, ආර්ථික ගැටලුවල සංකීර්ණ ස්වභාවය.
- දෙවන ලෝක යුද්ධයෙන් පසු කාලය තුළ අන්තර්ජාතික ක්ෂේත්‍රය තුළ ඇතිවන බල අරගලය.
- මූල්‍යමය වශයෙන් මධ්‍යම ආණ්ඩුව ශක්තිමත් වීම.

ස්විට්සර්ලන්තය සන්ධීය රාජ්‍යයක් ලෙස ගොඩනගා ගැනීම

සන්ධීය රාජ්‍යයක් බිහි කර ගැනීමට බලපෑ හේතු

- ප්‍රංශය, ඉතාලිය, ජර්මනිය සහ ඔස්ට්‍රියාව යන රටවල් හතරට මැදිව පිහිටා තිබීම හේතු කොට ගෙන ජාතික ආරක්ෂාවට තර්ජන එල්ල වීම.
- දැඩි භූගෝලීය විෂමතාව හේතුවෙන් ආර්ථික සංවර්ධනය ළඟා කර ගැනීම අපහසු වීම.
- වාර්ගික, භාෂා හා ආගමික විවිධත්වයට සාර්ථක විසඳුම් ලබා ගැනීම අවශ්‍ය වීම

මෙවැනි හේතු සාධක පදනම් කර ගනිමින් ස්විස්ටර්ලන්තය සන්ධීය රාජ්‍යයක් ලෙස බිහිවීම සිදුවිය. සන්ධීය රාජ්‍යයක් ලෙස ගොඩනගා ගැනීමට පෙර කුඩා ස්වාධීන රාජ්‍ය ගණනාවක් වශයෙන් භූමි ප්‍රදේශ පැවතුණි. 19 වන සියවසේ මැද භාගයේ දී කතෝලික ආගම අදහන පිරිස් හා ප්‍රොතෙස්තන්ත ආගම අදහන පිරිස් අතර සිවිල් යුද්ධයක් හට ගැනීම නිසා සන්ධීය ආණ්ඩුක්‍රමයක් ගොඩනගා ගැනීමෙන් එය අවසන් විය.

2.3 රූපය ස්විට්සර්ලන්තයේ භූගෝලීය සිතියම

වර්ග කිලෝමීටර 41,300කින් පමණ සමන්විත ස්විට්සර්ලන්තය, ජර්මන්, ප්‍රංශ, ඉතාලි හා රොමාන්ෂ් යන භාෂා කතා කරන ජන කණ්ඩායම්වලින් යුක්ත වන අතර එම භාෂා නිල භාෂා ලෙස ද සැලකේ.

ස්විට්සර්ලන්ත ව්‍යවස්ථාව පළමුව සම්මත කර ගනු ලැබුවේ මීට වසර 150කට පමණ පෙර දී ය. වරින් වර එය සංශෝධනයට ලක් කර ඇති අතර අවසන් වරට 1999 දී නව ව්‍යවස්ථාව සම්මත කර ඇත. ඒ අනුව කැන්ටන් නමින් හැඳින්වෙන ප්‍රාන්ත ආණ්ඩු 26ක් එම සන්ධීය ක්‍රමය තුළ ක්‍රියාත්මක වේ. ඒවාට ඉතා ඉහළ මට්ටමේ නිදහසක් හිමි කර දී තිබීම විශේෂ ලක්ෂණයකි.

2.4 රූපය ස්විට්සර්ලන්තයේ භූගෝලීය දර්ශනයක්

ස්විට්සර්ලන්ත සන්ධීය ක්‍රමයේ දේශපාලන ව්‍යුහය

- ව්‍යවස්ථාදායකය සන්ධීය මහා මණ්ඩලය ලෙස හඳුන්වන අතර ජාතික සභාව හා රාජ්‍ය සභාව යන ආයතන දෙකෙන් එය සමන්විත වේ.
- සාමාජිකයන් 7 දෙනෙකුගෙන් සමන්විත සාමූහික විධායකයක් ක්‍රියාත්මක වන අතර ඔවුන් පත් කරනු ලබන්නේ සන්ධීය මහා මණ්ඩලය විසිනි.
- සාමූහික විධායකය සන්ධීය සභාව නමින් හැඳින්වෙන අතර එහි සභාපතිවරයකු වේ. නමුත් එම සභාපතිවරයා අනෙක් සාමාජිකයන්ට වඩා උත්තරීතරත්වයක් නොදරයි.

මධ්‍යම ආණ්ඩුව සතු බලතල

- විදේශ කටයුතු
- යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම
- විදේශ රටවල් හා ගිවිසුම්වලට එළඹීම
- ආරක්ෂක හා හමුද කටයුතු
- පණිවුඩ හුවමාරුව, තැපැල් හා විදුලි සංදේශ

කැන්ටන් සතු බලතල

- අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය
- පුවත්පත් පාලනය
- මහාමාර්ග
- කර්මාන්ත
- ආගමන
- බෝවන රෝග වැළැක්වීම
- බැංකු කටයුතු

ස්විට්සර්ලන්ත සන්ධීය ක්‍රමයේ සුවිශේෂ ලක්ෂණ

- මධ්‍යම ආණ්ඩුව හා කැන්ටන් සතු බලතල දක්වා ඇති අතර ඉතිරි සියලු බලතල මධ්‍යම ආණ්ඩුවට හිමි වීම.
- බලතල ක්‍රියාවට නැංවීමේ දී ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් එය විසඳීමේ බලය සන්ධීය මහා මණ්ඩලය සතු වීම.
- කැන්ටන්වලට තම බලය ක්‍රියාවට නංවමින් ස්වාධීන ව කටයුතු කිරීමේ අවස්ථාව අහිමි වීම.
- කැන්ටන් විසින් සිය තීරණ ගැනීමේ දී මහජන අදහස් විමසීමට සෘජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම භාවිත කිරීම.